රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ අමාත්‍යාංශය
பொது நிருவாகம், உள்நாட்டலுவல்கள் மற்றும் நீதி அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION, HOME AFFAIRS AND JUSTICE

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:(94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்:(94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: COMS/Trans/වා.ස්.මා./2019
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.11.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්,දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම**
**රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, සංවර්ධන නිලධාරී සේවය,ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය, ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය**

ඉහත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2018.10.04 දිනැති ලිපිය මගින් එවා ඇති වාර්ෂික ස්ථාන මාරු කමිටු යෝජනා හා එම ලිපියේ සඳහන් කරුණු වලට ඔබගේ කාරුණික අවධානය යොමු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරු යෝජනා සම්බන්ධව මා වෙත ඉදිරිපත් වූ කරුණු දැක්වීම් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 210 සහ 211 වගන්ති අනුව වූ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ මේ සමඟ එවමි. මෙමගින් සිදු කරනු ලැබූ සංශෝධනයන්ට යටත්ව ඉහත සඳහන් නිලධාරීන් සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2018.10.04 ලිපිය මගින් යෝජිත 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග මෙයින් අනුමත කරමි.

03. **ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් වන අභියාචනා :**

(අ) ස්ථාන මාරු නියෝගයන් සම්බන්ධයෙන් අතෘප්තියට පත් නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති **XX වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(ආ) සමාලෝචන කමිටුවට අයදුම්පත් ඉදිරිපත් කළ නිලධරයන්ට **පමණක්** රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කළ හැකිය.

(ඇ) අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක: 5A නිසි පරිදි සම්පූර්ණ කර තම **දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මා වෙත** එවිය යුතුය. ඒ සමඟම අභියාචනයෙහි සඳහන් කරුණු සනාථ කිරීමට අදාළ ලේඛනද අමුණා එවන්නේ නම් මැනවි.

(ඈ) ඉදිරිපත් කරන අභියාචනයන් **2018.12.21** දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන ලෙස ඉදිරිපත් කළ යුතු අතර එදිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

04. **වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම.**

2019 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි වෙනස්කම් වලට යටත්ව 2019.02.01 දිනට හෝ අදාළ ස්ථාන මාරු නියෝග වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වේ. (2019.01.02 දින සිට 2019.01.31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක වන සේ අනුමත කරන ලද ස්ථාන මාරු 2019.02.01 දින සිට ක්‍රියාත්මක වේ.) ඒ අනුව ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධරයන් නියමිත දිනයේ නව සේවා ස්ථානයන්හි රාජකාරි බාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන මුදා හැරීමට ක්‍රියාකරන ලෙස දන්වා සිටිමි. **වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධාරියෙකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී එම**

**නිලධරයා ස්ථාන මාරුව ලබා ඇති දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදුකර මා වෙත දැන්විය යුතුය.** 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නව සේවා ස්ථානයට වාර්තා කරන නිලධරයන්ද, මුදාහල නිලධරයන්ද, පිළිබඳව මේ සමඟ වන ඒ.සේ/වා.ස්.මා/ 07, සහ ඒ.සේ/වා.ස්.මා/ 08 ආකෘති මඟින් <u>ස්ථාන මාරු ක්‍රියාත්මක වන දින සිට මාස 02 ක් ඇතුළත</u> මා වෙත වාර්තා කළ යුතුය. ඒ සමඟ අදාළ නිලධරයන් සේවයට වාර්තා කළ බවට හා මුදාහල බවට වන ලිපි වල පිටපත්ද ඉදිරිපත් කල යුතුය. (ඒ.සේ/වා.ස්.මා/ 05, හා ඒ.සේ/වා.ස්.මා/ 06)

05. වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ මා විසින් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගවලට අමතරව අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග යටතේ කිසියම් නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් ලැබී තිබුනේ වුවද, මෙම සමාලෝචන කමිටු තීරණවලින් වූ සංශෝධන වලට යටත්ව 2018.10.04 දිනැති වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු බව සැලකීම මැනවි.

06. තවද 2019 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධාරියෙක් ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳ ගැටළුවක් පවතී නම්, එවැනි අවස්ථාවලදී අදාළ නිලධාරියා අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධාරියාගේ සේවා ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව දන්වමි.

කේ.වී.පී.එම්.ජේ.ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**ආකෘති පත්‍ර අංක: 5A**

**වාර්ෂික ස්ථානමාරු පිළිබඳ අභියාචනා**

2019 වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම -අභියාචක පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම:- | | | |
| 02. තනතුර හා පන්තිය:- | | | |
| 03. උපන් දිනය:- | 04. වයස:- (2018.12.31 දිනට) | 05. ජාතික හැඳුනුම්පත් අංකය:- | 06. ස්ත්‍රී/පුරුෂ භාවය:- |
| 07. ස්ථිර ලිපිනය:-<br><br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:-<br><br>දිස්ත්‍රික්කය:- | | 08. තාවකාලික ලිපිනය:- | 09. දුරකතන අංකය<br><br>කාර්යාලය:-<br><br>පෞද්ගලික:- |
| 10. විවාහක/අවිවාහක බව | 11. කලත්‍රයාගේ නම:- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය:- | |
| 13. දරුවන් ගණන:- | 14. ඔවුන්ගේ වයස:- | 15. ඉගෙනුම ලබන පාසැල්:- | |

**ආ. සේවා තොරතුරු**

| | |
|---|---|
| 16. තනතුරට පත් වූ දිනය:- | |
| 17. වර්තමාන සේවා ස්ථානය:- | 18. සේවා ස්ථානය පිහිටි නගරය:- |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය:- | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2018.12.31 දිනට)<br>අවු ……….. මාස ………. දින ………. |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රියමනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවා සේවය කර තිබේද? | |

| 22. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | | සේවා ස්ථානය | ප්‍රිය මනාප සේවා ස්ථානයකි/ ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| | 1 | | | | |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |
| | 5 | | | | |
| | 6 | | | | |

**ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)**

| 23.වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන | |
|---|---|---|---|
| ඇත | නැත | 1 | |
| | | 2 | |
| | | 3 | |
| | | 4 | |
| | | 5 | |

ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය:-

ස්ථාන මාරු ලැබී ඇති සේවා ස්ථානයට, නිලධරයා ස්ථිර පදිංචි ස්ථානයේ සිට ඇති දුර (කි.මී) :-

ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධාරීන් ගණන:-

24. නිලධරයා මීට පෙර වර්ෂවලදී වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කර තිබේද?
ස්ථාන මාරු ඉල්ලුම් කර ඇත්නම්, ස්ථාන මාරු ඉල්ලුම් කර ඇති වර්ෂ හා ඉල්ලුම් කර ඇති සේවා ස්ථාන

| | ඉල්ලුම් කළ වර්ෂය | ඉල්ලුම් කරන ලද සේවා ස්ථාන |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

25. ඉහත අංක 24 පරිදි ඉල්ලුම් කරන ලද වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සම්බන්ධයෙන් ලැබී ඇති තීරණ :-

(ස්ථාන මාරුවක් ලැබී නොමැති නම් ඒ බව ද සඳහන් කරන්න)

**ඇ.සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු:-**

| 26. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | ඇත | |
|---|---|---|
| | නැත | |

| 27 .සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම-: | | | |
|---|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන | |
| ස්ථාන මාරුව සංශෝධනය කිරීම | | 1 | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2 | |
| | | 3 | |

28. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය :-

ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ තොරතුරු

29. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු -

1. ……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………………
……………………………………………………………………………………………………

30. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත

ඇමුණුම 1……………………………………………………………………………………………

ඇමුණුම 2……………………………………………………………………………………………

ඇමුණුම 3……………………………………………………………………………………………

31. ඉල්ලා සිටිනු ලබන සහන -

1. ……………………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………………

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

……………………………… ………………………………

දිනය අත්සන

ඊ. අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

නිලධාරියා/නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. 2019 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි. පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

i. ……………………………………………………………………………………………………
ii. ……………………………………………………………………………………………………
iii. ……………………………………………………………………………………………………

……………………………………… ………………………………

දිනය අත්සන

උ. ස්ථාන මාරු බලධරයාගේ නිර්දේශය :-

I. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ වන නිලධාරීන් ගණන .......................................

II. අභියාචනය පිළිබඳ නිර්දේශය :

...................................................................................................................................................
...................................................................................................................................................
...................................................................................................................................................
...................................................................................................................................................
...................................................................................................................................................

.......................... ................................................

දිනය අත්සන

ඒ.සේ./වා.ස්.මා. /05

නම :-........................................................

සේවා ස්ථානය :-....................................................................................................................

දිනය :-........................................................

............................................................. මගින්,

............................................................. මගින්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

<u>නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීම</u>

..................(වසර) වසරේ ඒකාබද්ධ ........................................................(සේවය) සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ................................(මුදා හරින ලද දිනය) දින සිට සේවයෙන් මුදා හරින ලද මා ............................(සේවයට වාර්තා කළ දිනය) දින ................................................. (සේවා ස්ථානය) සේවයට වාර්තා කළ බව කාරුණිකව දන්වමි.

මෙයට විශ්වාසී,

අත්සන :- .....................................................

සේවය :- .....................................................

ශ්‍රේණිය :- .....................................................

ජාතික හැඳුනුම්පත් අංකය:- .....................................................

සේවක අංකය :- .....................................................

---

මගේ අංකය :- .............................................

දිනය :- .............................................

සේවයට වාර්තා කළ බව තහවුරු කරමි.

.......................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

ඒ.සේ./වා.ස්.මා. /06

මගේ අංකය :- ..........................................

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :- ...................................................................................

දිනය :- ..........................................

........................................................................මගින්,

........................................................................මගින්,

........................................................................මහතා/මිය/මෙය

තනතුර :- ..........................................................

<u>වාර්ෂික ස්ථාන මාරු ලැබීම මත සේවා ස්ථානයෙන් මුදා හැරීම.</u>

.............(වසර) වසරේ ඒකාබද්ධ ...............................................(සේවය) සේවයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව ඉහත නම් සඳහන් නිලධාරියා/නිලධාරිනිය ..............................................................................(නව සේවා ස්ථානය) වෙත සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි ..................................(මුදා හරිනු ලබන දිනය) දින සිට සේවයෙන් මුදා හරින බව කාරුණිකව දන්වමි.

.......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

පිටපත:-

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඒ.සේ./වා.ස්.මා. /07

......................................................................................අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලය වෙත ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්.

සේවය:-..........................................................................

| නිලධාරියාගේ නම | සේවක අංකය | ශ්‍රේණිය | සේවයට වාර්තා කළ දිනය | ඒ.සේ./වා.ස්.මා. /05 ආකෘතිය ඒ.සේ.අ.ජ. වෙත යවා තිබේද? |
|---|---|---|---|---|
| | | | | |

..........................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

ඒ.සේ./වා.ස්.මා. /08

......................................................................................අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලය වෙතින් ස්ථාන මාරුවී ගිය නිලධාරීන්.

සේවය:-..........................................................................

| නිලධාරියාගේ නම | සේවක අංකය | ශ්‍රේණිය | මුදා හරින ලද දිනය | ඒ.සේ./වා.ස්.මා. /06 ආකෘතිය ඒ.සේ.අ.ජ. වෙත යවා තිබේද? |
|---|---|---|---|---|
| | | | | |

..........................................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.